සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

# තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019

# Third Term Test - Grade 8 - 2019

නම : ............................................... සිංහල භාෂාව හා සාහිත්‍යය කාලය : පැය 02 යි.

වැදගත් :

- සියලු ම ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුරු සපයන්න.

## I කොටස

(1) පහත සඳහන් ප්‍රස්තාව පිරුළුවලින් එකක් වැරදිය. එම පිරුළ තෝරා යටින් ඉරක් අඳින්න.

(i) හොරාගේ අම්මාගෙන් පේන ඇහුවා වගේ. (ii) ඉබ්බා කට හින්දා නැහුණා වගේ.

(iii) පාළු ගෙයි වළං බිඳිනවා වගෙයි. (iv) කටුස්සාගේ කරේ මසුරන් බැන්දා වගේ.

(2) පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පදයට වඩාත් ගැළපෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

අම්මා **කඩිමුඩියේ** උදෑසන ආහාරය පිළියෙල කළාය.

(i) ඉතා ප්‍රණීත ලෙස (ii) උණු උණුවේ

(iii) කලබලයෙන් (iv) ඉතා සෙමෙන්

- අංක 03 හා 04 ප්‍රශ්නවල හිස්තැන් පිරවීමට සුදුසු පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(3) වැහි ........................................... නිසා පරිසරය පුරා අඳුර පැතිරී තිබිණි.

(i) වලාකුළු (ii) වලාකුලු (iii) වළාකුලු (iv) වළාකුළු

(4) ජයග්‍රාහකයින්ට ත්‍යාග................... කිරීම විදුහල්පතිතුමා අතින් සිදු විය.

(i) ප්‍රධානය (ii) ප්‍රදානය (iii) ප්‍රධාණය (iv) ප්‍රදාණය

(5) උද්ධෘත පාඨයක මුලින් හෝ මැදින් හෝ කොටසක් අත්හළ බව දැක්වීම සඳහා යොදාගනු ලබන විරාම ලක්ෂණය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) දෙතිත (ii) තිත්තුන (iii) තිත් හතර (iv) යුගල උඩුකොමා

- අංක 06 හා 07 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරා යටින් ඉරක් අඳින්න.

(6) ආලෝකය

(i) කිරණ (ii) අලු (iii) තිමිර (iv) ප්‍රභාතය

(7) ප්‍රබල

(i) දුබල (ii) සුබල (iii) විරල (iv) නිමල

(8) 'නරිබෑනා' නාට්‍යයේ නිර්මාණකරුවා දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) රෝහණ දන්දෙණිය මහතා (ii) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

(iii) දයානන්ද ගුණවර්ධන මහතා (iv) හෙන්රි ජයසේන මහතා

(9) රකාරාංශය, රේඵය, දීර්ඝ පාපිල්ල පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) කර්මය, පූජාවලිය, ක්‍රමය (ii) වස්ත්‍රය, රූපය, ධර්මය

(iii) ප්‍රගුණ, සුපුෂ්පිත, රුවල (iv) ප්‍රසිද්ධ, කර්මය, රූපය

(10) සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සඳලුතලය (ii) සැඳෑව (iii) ඉඳුවර (iv) එළුවා

(11) පහත සඳහන් කවි පදයෙහි ඉරි ඇඳි පදය අයත් වන ක්‍රියා වර්ගය තෝරා යටින් ඉරක් අඳින්න.

සුරවර සැරද විබිසණ දෙව් කැළණි පුර

(i) ප්‍රයෝජ්‍ය ක්‍රියා (ii) විධි ක්‍රියා (iii) පූර්ව ක්‍රියා (iv) ආශිර්වාද ක්‍රියා

(12) නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පද පමණක් අඩංගු පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) පරිසණකය, වීරෝධාර, සමස්ථ (ii) පිළිවෙළ, නිෂ්පාදන, ප්‍රශ්න

(iii) පළතුරු, එළවළු, පුස්තකාලය (iv) මර්ධනය, වර්ධනය, ගැහැණිය

(13) අකාරාදී පිළිවෙළ නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) පරාස්ස, මනමේ, තලමල පිපිලා

(ii) හංස සන්දේශය, පරවි සන්දේශය, සැලළිහිණි සන්දේශය

(iii) කලියුගය, ගම්පෙරලිය, යුගාන්තය

(iv) කරුමක්කාරයෝ, රතු රෝස මල, දියමන්ති මාලය

(14) පහත සඳහන් වාක්‍යයේ ඉරි ඇඳි පදවල අදහස නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

සැදැහැවත් <u>දන</u> තම වස්තුව වියදම් කර මහ සඟරුවන උදෙසා මහ <u>දන</u> පූජා කළහ.

(i) වස්තුව, දානය (ii) දානය, ජනයා (iii) ජනයා, දානය (iv) ජනයා, වස්තුව

(15) පහත සඳහන් පදවල අරුත් ලියන්න.

(i) ප්‍රදීපස්ථම්භයක් ................................................ (ii) ත්‍රිශූලය ................................................

(16) පහත සඳහන් පදවල අනුක්ත පද ලියන්න

(i) ශිෂ්‍යාවක් ................................................ (ii) බැතිමත්හු ................................................

(17) පහත සඳහන් වගුව සුදුසු ආඛ්‍යාත පද යොදා හිස්තැන් පුරවන්න.

| පුරුෂය | ඒක වචන | බහු වචන |
|---|---|---|
| මධ්‍යම පුරුෂ | ................................ | වන්නෙහු |
| ප්‍රථම පුරුෂ | නැටුවේය. | ................................ |

(18) පහත සඳහන් පද දෙකෙහි තද්ධිත ප්‍රත්‍ය හා නාමය වෙන් කොට ලියන්න.

(i) දේශීය ................................................ (ii) බුද්ධිමත් ................................................

(19) 'ප්‍රෞඪ' යන වචනයේ සඳහන් 'ඪ' අක්ෂරය හඳුන්වන නාමය සහිත පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(i) සඤ්ඤක අක්ෂරයකි. (ii) මහාප්‍රාණ අක්ෂරයකි.

(iii) මූර්ධජ අක්ෂරයකි. (iv) අල්පප්‍රාණ අක්ෂරයකි.

(20) පහත සඳහන් කවියෙහි ඉතිරි පද දෙක සම්පූර්ණ කර ලියන්න.

කෙළියට කඩක් සඟවා යහළුවකු ගෙනේ

එළිකොට නැවත දුන් මිනිසකුට එතෙකිනේ

................................................................................................................................

................................................................................................................................

# II කොටස

ℓ පළමු, දෙවන හා තෙවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු ලියන්න.

(01) (i) රාජකාරී ලිපියක ආකෘතියේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් නම් කරන්න.

(ii) ලෝවැඩ සඟරාව කෘතියේ රචකයා නම් කරන්න.

(iii) 'සිරිත් මල්දම' පද්‍ය සංග්‍රයේ නිර්මාණකරුවාගේ නම කුමක් ද?

(iv) ''වෙළී වෙළී වෙළී ඉස සිට දෙපතුළට වෙළී කන්දේ ගියා මලක් සොයාගන්නට කියා නාමල් තිබෙන්නා සපුමල් තිබෙන්නා පිච්ච මල් තිබෙන්නා එයින් එකක් ගෙනැල්ලා පැළැන්දා සේ ම

මලී මලී මලී නුඹේ කොණ්ඩේ තිබෙන මලී'' මෙම කොටස අයත් කාව්‍ය වර්ගය සඳහන් කරන්න.

(v) කාවාඩි පූජා වර්ග දෙකක් සඳහන් කරන්න. (ලකුණු 2 x 5 = 10)

(02) පහත සඳහන් මාතෘකාවලින් කැමති එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.

(i) යහපත් ආහාර රටාවක් තුළින් සෞඛ්‍ය සම්පන්න දිවියක්.

(ii) තාක්ෂණය නිවැරදිව භාවිතයෙන් අධ්‍යාපනය ජය ගනිමු.

(iii) අපේ සංස්කෘතික උරුම සුරකිමු.

(iv) ප්ලාස්ටික්, පොලිතින්වලින් තොර සුරක්ෂිත පරිසරයක් ගොඩනගමු.

(v) මා සඳ මතට පා තැබුවොත් (ලකුණු 20)

(03) ඔබ, පාසලේ 6-9 අංශයේ සිංහල සාහිත්‍ය සංගමයේ ලේකම් යැයි සිතා, පාසලේ ඉදිරිපිට මාර්ගයේ පාසල ආරම්භ වන හා අවසන් වන වේලාවට ඇති වන මාර්ග තදබදය අඩු කරගැනීම සඳහා පොලිස් රථවාහන අංශයේ නියාමකවරයකුගේ සහය ඉල්ලමින් ප්‍රදේශයේ පොලිස් ස්ථානාධිපතිතුමා වෙත යවන රාජකාරී ලිපිය ලියන්න.

(ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

නිෂ්පාදනයක සම්පූර්ණ අයිතිය හිමිවන ආණ්ඩුවේ බලපත්‍රය හෙවත් පේටන්ට් බලපත්‍රය හිමි කරගත් කුලසිංහ නිෂ්පාදන අතුරින් පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන, දැඩි පීඩනයට ඔරොත්තු දෙන රබර් නළ වර්ග, විශේෂ සෙවිලි උළු කැටයක්, සිමෙන්ති හා කෙඳි මිශ්‍රණයකින් තැනූ සෙවිලි තහඩුවක්, කොන්ක්‍රීට් ගොඩනැගිලි උපාංග සහ කොන්ක්‍රීට් තිරස් බාල්ක ලොවපුරා ප්‍රචලිතව ඇත.

1960 දී පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදනය වෙනුවෙන් ලද ඉන්දීය ජනාධිපති සම්මානයක්, 1979 දී මොරටුව විශ්ව විද්‍යාලයෙන් පිරිනැමූ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධියත්, 1986 දී ලද විද්‍යාජෝති සම්මානයත් විද්‍යා පර්යේෂණයන් වෙනුවෙන් ලැබුණු විශ්ව ප්‍රසාදිනී සම්මානයත්, ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයෙන් පිරිනැමූ ආචාර්ය උපාධියත් කුලසිංහයන්ගේ ශ්‍රේෂ්ඨත්වය ලොවට ම හඬගා කියයි.

ශ්‍රී ලංකා ඉංජිනේරු විද්‍යාවේ පියා යන විරුදාවලියෙන් පිදුම් ලද ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමාගේ සේවය සදා අමරණීය වේ.

(1) නිෂ්පාදනයක සම්පූර්ණ අයිතිය හිමිවන ආණ්ඩුවේ බලපත්‍රය හඳුන්වන විශේෂ නම කුමක් ද?

(2) නිෂ්පාදනයක අයිතිය හිමිවන ආණ්ඩුවේ බලපත්‍රය ලබාගත් කුලසිංහ නිෂ්පාදන දෙකක් සඳහන් කරන්න.

(3) පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදනය වෙනුවෙන් කුලසිංහ මහතා ලබාගත් සම්මානය කුමක් ද?

(4) ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමා ලද විරුදාවලී නාමය කුමක් ද?

(5) පහත සඳහන් පද සඳහා සාමානාර්ථවත් පද ඡේදයෙන් තෝරා ලියන්න.

(i) තද (ii) උදාරත්වය

(05) පහත සඳහන් ප්‍රකාශ ඇතුළත් පාඩමේ නම හා එය ප්‍රකාශ කළේ කවුරුන් ද යන්න සඳහන් කරන්න.

(i) ''අපි බුද්ධපුත්‍රයෝ, ඉතින් මොකට ද ඔය අන්‍යාගමික පොත් කියවන්නේ.''

(ii) ''අනේ බුදු ගමහාමුදුරුවනේ, මාව මරණ්ඩ එපා. මගේ පණ කෙන්ද රැකගෙන යන්ඩ ඉඩ අරින්න....''

(iii) ''මම දැක්කා අධිරාජ්‍යයාගේ ඇස්වලට කඳුළු උනනවා...''

(iv) ''ඒයි ළමයා, උඩට මක්කද ඕනෑ?''

(v) ''ආශිර්වාදය වගේ ම පුතේ, තව දෙයක් තියෙනවා. තමන් අතින් යම් වැඩිහිටියෙකුට වරදක් සිද්ධවෙලා තියෙනවා.....'' (ලකුණු 2 x 5 = 10)

(06) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා වාක්‍යය නැවත ලියන්න.

(i) බැතිමත්හු................................................ (දෙවියන්/ දෙවියෝ) පුදති.

(ii) .................................................. (දැරියක් / දැරියක) රංගනයක් ඉදිරිපත් කළාය.

(iii) නුඹලා හොඳින් පාඩම් .............................................. (කළහ/කළෙහු)

(iv) සියලු ලෝක සත්වයෝ යහපත් සිත් ඇත්තෝ .......................................................... (වේවා!/ වෙත්වා!)

(v) .......................................................... (කුරුල්ලෝ/ කුරුල්ලන් ) ඈත අහසෙහි පියාඹති.

(vi) නපුරු කොටියා .................................................. (මුවෙක්/ මුවෙකු) ලුහුබැන්දේය.

(vii) .................................................. (රියදුරන් /රියදුරෝ) සැලකිලිමත්ව රිය ධාවනය කරති.

(viii) විදුහල්පතිතුමා .................................................................. (ශිෂ්‍යනායකයෙක්/ශිෂ්‍යනායකයකු) කැඳවූයේ ය.

(ix) රාත්‍රී අහසේ තාරකා දීප්තිමත් ව ....................................................... (බැබළෙති/ බැබළෙයි)

(x) දෙමාපියෝ .......................................................... (අපි/අප) යහමඟ යැවීමට කටයුතු කරති.

(ලකුණු 1 x 10 = 10)

(07) (i) පහත සඳහන් පදවලට උපසර්ග පද යොදා විරුද්ධාර්ථ පද සකස් කරන්න.

1. කුසල් ...............................................
2. අවුල් ...............................................
3. පැහැ ...............................................
4. කැළැල් ...............................................

(ii) පහත සඳහන් නාම පදයට හා ක්‍රියාපදයට සුදුසු විශේෂණ පද යොදා නිවැරදි වාක්‍ය දෙකක් නිර්මාණ කරන්න.

1. ගුරුතුමිය 2. දුවයි.

(iii) 'තුරු' යන බහ්වර්ථ පදය විවිධ අර්ථ මතු වන පරිදි නිවැරදි වාක්‍ය දෙකක් නිර්මාණය කරන්න.

(iv) පහත සඳහන් පාඨ දෙකෙහි ඇති විධික්‍රියා පද තෝරා ලියන්න.

1. ''පින් පිඬ වැනි මා මැණිය කියනු නොවළහා''
2. ''කොතරම් නරයන් මැරුව ද මා මැරීම නුඹ සිතන ලෙස පහසු නොවන බව දැනගනු යෙහෙකි.''

(v) පහත සඳහන් අදහස් දීම සඳහා යෙදෙන තනි පද ලියන්න.

1. බොහෝ කලක සිට පැවත එන
2. පෙර තිබූ තත්වයට සකස් කිරීම.

Anwer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

## තෙවන වාර පරීක්ෂණය - 8 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 8 - 2019

### සිංහල භාෂාව හා සාහිත්‍යය - පිළිතුරු පත්‍රය

## I කොටස

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 01. | iv | 08. | iii | 15. | (i) පහන් ටැඹක් | (ii) උල් තුනක් සහිත ආයුධය |
| 02. | iii | 09. | iv | 16. | (i) ශිෂ්‍යාවක | (ii) බැතිමතුන් |
| 03. | iv | 10. | iv | 17. | (i) වන්නෙහි | (ii) නැටුවෝය/ නැටූහ. |
| 04. | ii | 11. | iv | 18. | (i) දේශ + ඊය | (ii) බුද්ධි + මත් |
| 05. | ii | 12. | ii | 19. | | |
| 06. | iii | 13. | iii | 20. | | (ලකුණු 2 x 20 = 40) |
| 07. | i | 14. | iii | | | |

## II කොටස

01. (i) යවන්නාගේ නම හා ලිපිනය/ දිනය/ ලබන්නාගේ ලිපිනය/ මාතෘකාව/ ආමන්ත්‍රණය/ අන්තර්ගතය/ අත්සන
    (ii) විදාගම මෛත්‍රී හිමි
    (iii) ඇම්. එල් ද සිල්වා ගුරු මුහන්දිරම්
    (iv) ටීකා සීපද
    (v) පරවි කාවාඩි/ භක්ති කාවාඩි/ ගිනි කාවාඩි/ කිරි කාවාඩි/ මත්ස්‍ය කාවාඩි

02. සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.

03. ආකෘතිය, අන්තර්ගතය, ශිල්පීය දක්ෂතා අදාළ පරිදි ලකුණු ලබා දෙන්න.

04. (i) පේටන්ට් බලපත්‍රය
    (ii) පෙරසවි කොන්ක්‍රීට් නිෂ්පාදන .................................. (ඡේදයේ සඳහන්ව ඇත)
    (iii) ඉන්දීය ජනාධිපති සම්මානය
    (iv) ශ්‍රී ලංකාවේ ඉංජිනේරු විද්‍යාවේ පියා
    (v) 1. තද - දැඩි 2. උදාරත්වය - ශ්‍රේෂ්ඨත්වය

05. (i) බොදු පුනරුදයේ සෙන්පතියාණෝ/ ලොකු හාමුදුරුවෝ
    (ii) පරාස්ස/ කාළහීෂණ
    (iii) සැබෑ ළෙංගතුකම/ පුංචි කිරිල්ලිය
    (iv) අවුරුදු සිහිනය/ වේදිකාවේ සිටි මිනිසා (වෙළෙන්දා)
    (v) අලුත් අවුරුදු උත්සවය/ සීයා

06. (i) දෙවියන් (ii) දූරියක් (iii) කළෙහු (iv) වෙත්වා ! (v) කුරුල්ලෝ
    (vi) මුවෙකු (vii) රියදුරෝ (viii) ශිෂ්‍ය නායකයකු (ix) බැබළෙයි (x) අප

07. (i) (1) අකුසල් (2) නිරවුල් (3) අවපැහැ (2) නිකැලැල්
    (ii) සුදුසු පරිදි ලකුණු ලබා දෙන්න.
    (iii) නිවැරදි වාක්‍ය සඳහා ලකුණු ලබා දෙන්න.
    (iv) 1. කියනු 2. දැනගනු
    (v) 1. චිරාගත 2. ප්‍රතිසංස්කරණය